SRI LANKA

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# අදියර II විභාගය - 2022 ජුලි

# යෝජිත උත්තර

# (203) ව්‍යාපාර නීතිය (BLA)

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන: 011-2-559 669

**මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි**

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

**අදියර II විභාගය - 2022 ජූලි**

# (203) ව්‍යාපාර නිතිය

# යෝජිත උත්තර

(මුළු ලකුණු 25)

**A කොටස**

***පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ***

**1.1** (3)

**1.2** (2)

**1.3** (4)

**1.4** (4)

**1.5** (3)

**1.6** (3)

*(එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 12)*

**1.7** අසත්‍ය

**1.8** සත්‍ය

**1.9** අසත්‍ය

*(එකකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 03)*

**1.10**

1) ප්‍රකාශනයෙන්
2) ව්‍යංග එකඟතාවයෙන්
3) අපරානුමත කිරීමෙන්
4) අවශ්‍යතාවය හේතුවෙන්
5) ප්‍රතිබන්ධනයෙන්

**1.11**

1) ගිවිසුමේ විස්තර කර ඇති ප්‍රමිතියට අනුව නෞකාවට භාණ්ඩ පැටවීම
2) ගිවිසුම මගින් එකඟ වී ඇති ගමනාන්තය වෙත භාණ්ඩ භාර දීම සඳහා වන ප්‍රවාහන ගිවිසුමකට එළඹීම
3) ගැණුම්කරුට වාසිදායී වන ආකාරයේ රක්ෂණ ගිවිසුමක් සකස් කිරීම
4) භාණ්ඩ සඳහා ඉන්වොයිස් පත්‍ර සැකසීම
5) භාණ්ඩ පැටවීමෙන් පසු සාධාරණ කාලයක් ඇතුළතදී ගැණුම්කරුට ලේඛන යැවීම

**1.12**

1) පාලන පරීක්ෂණය
2) උපකරණ පරීක්ෂණය
3) ඒකාබද්ධ පරීක්ෂණය
4) ආර්ථික තථ්‍යතා පරීක්ෂණය

**1.13**

1) සතියේ නිවාඩු දින
2) පොහොය නිවාඩු දින
3) අනියම්
4) නිවාඩු
5) රජයේ
6) නිවාඩු
7) වාර්ෂික නිවාඩු
8) මාතෘ නිවාඩු

**1.14**

ආභ්‍යන්තරික වෙළඳාම යනු සමාගම (මෙහිලා ලැයිස්තුගත සමාගමක් අදහස් වේ) සම්බන්ධව වන පොදු නොවන තොරතුරු සඳහා ප්‍රවේශය ඇති තනි පුද්ගලයන් විසින් සමාගමේ තොග හෝ වෙනත් සුරැකුම් වෙළඳාම් කිරීමයි. වෙනත් වචන වලින් කියන්නේ නම් ආභ්‍යන්තරික වෙළඳාම යන්නෙන් අදහස් වනුයේ පොදු ජනතාවට ලබා ගත නොහැක්කා වූ වැදගත් තොරතුරු මත පිහිටා තොග, බැඳුම්කර හෝ වෙනත් සුරැකුම් මිලට ගැනීම හෝ විකිණීම වේ.

***(එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 10)***

***(මුළු ලකුණු 25)***

***A කොටසෙහි අවසානය***

SRI LANKA

(මුළු ලකුණු 50 කි)

**B කොටස**

## *දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

***පරිච්ඡේදය 03 - භාණ්ඩ විකිණීමේ නීතිය***

**(a)** මෙයට පදනම් වනුයේ භාණ්ඩ විකිණීම සම්බන්ධ නීතිය/භාණ්ඩ විකිණීමේ ආඥා පනතෙහි අන්තර්ගත ව්‍යංග කොන්දේසි වේ.

භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව, විකුණුම්කරුට විකිණීමක් සම්බන්ධව භාණ්ඩ විකිණීම සඳහා අයිතියක් ඇති අතර, විකිණීමට එකඟ වීමේ ගිවිසුමකදී ඔහුට භාණ්ඩ විකිණීම සඳහා අයිතියක් හිමි වනුයේ භාණ්ඩය හුවමාරු වන අවස්ථාවේදීය. ව්‍යාවස්ථාපිතව පනවා ඇති මෙකී ව්‍යංග නියමයට අනුව කටයුතු කිරීමට විකුණුම්කරු අපොහොසත් වන්නේ නම්, එය විකුණුම්කරු විසින් විකුණුම් ගිවිසුම උල්ලංඝනය කිරීමක් වනු ලැබේ.

**නඩු තීන්දු නීතිය** - <u>රෝලන්ඩ්</u> එදිරිව. <u>දිවාල්</u>

දෙන ලද ගැටලුවේදී පෙනී යන්නේ, පීටර් විසින් ලොරි රථය අලුත්වැඩියා කිරීම සඳහා තබා ගත්තක් වන බැවින් ජේම්ස්ට විකිණීම සිදු කරන අවස්ථාවේදී ලොරි රථය සම්බන්ධව අයිතියක් නොමැති බවත්, ඔහු විසින් විකිණීමට ඇති අයිතියකින් තොරව ලොරි රථය විකිණූ හෙයින් භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ ව්‍යංග කොන්දේසියක් උල්ලංඝනය කර ඇති බවත්, සද්භාවීය ගැණුම්කරුවෙකුට විඳීමට සිදු වන්නා වූ අලාභයන් ගෙවීමට බැඳී සිටින බවත් වේ. එබැවින්, ලැරීට ජේම්ස්ට එරෙහිව නඩු කටයුත්තක් ආරම්භ කළ හැකි අතර ලැරී විසින් ගෙවන ලද සියලු මුදල් නැවත ගෙවීමට ජේම්ස් බැඳී සිටිනු ලබයි.

***(ලකුණු 06)***

**(b)** පහත ඒවායන් ඕනෑම දෙකක් (**02**) පැහැදිලි කරන්න

**පවත්නා භාණ්ඩ**

පවත්නා භාණ්ඩ යනු ගිවිසුමට එළඹෙන අවස්ථාවේදී විකුණුම්කරුට අයිතිව හෝ ඔහුගේ භුක්තියෙහි පවතින භාණ්ඩ වේ. මෙයට උගස් තබන ලද හෝ කුලියට දෙන ලද හෝ නියෝජිතයෙකුගේ භුක්තියෙහි පවතින භාණ්ඩ අන්තර්ගත වේ.

උදා - **ශෙහාන්** යනු වාහන වෙළෙන්දෙකි. ඔහු ජපානයෙන් ආනයනය කරන ලද හොන්ඩා සිවික් වර්ගයේ වාහනයක් ප්‍රසාද්ට විකිණීමට එකඟ වේ. ගිවිසුම ඇති කර ගන්නා අවස්ථාවේදී වාහනය ශෙහාන්ගේ භුක්තියෙහි තිබූ බැවින්, එම වාහනය පවත්නා භාණ්ඩයක් වේ. පවත්නා භාණ්ඩ විශේෂිත හෝ අවිනිශ්චිත භාණ්ඩ වශයෙන් පැවතිය හැකිය. අයිතිය හුවමාරු වීමේදී සහ පාර්ශ්වයන් සතුව පවත්නා ප්‍රතිකර්මයන් බලාත්මක කිරීමේදී භාණ්ඩයන්ගේ ස්වාභාවය වැදගත් වේ.

**විශේෂිත භාණ්ඩ/නිශ්චිත භාණ්ඩ**

නිශ්චිත හෝ විශේෂිත භාණ්ඩ යනු ගිවිසුමට එළඹෙන අවස්ථාවේදී විෂය වස්තුව වශයෙන් පාර්ශ්වයන් විසින් එකඟ වී සහ හඳුනාගෙන ඇති භාණ්ඩ වේ.

උදා - ශෙහාන්ට හොන්ඩා සිවික් වාහන පහක් හිමි වේ නම් සහ ඔහු විසින් නිල් පැහැති සහ **12345432** දරණ එන්ජින් අංකය දරණ වාහනය විකිණීමට එකඟ වේ නම්, ගිවිසුමේ විෂය වස්තුව විශේෂිත භාණ්ඩයක් වේ.

**අවිනිශ්චිත භාණ්ඩ**

පාර්ශ්වයන් විසින් එකඟ වී ඇති නමුත්, ඒ වන විටදීත් භාණ්ඩ නිසි පරිදි හඳුනාගෙන නොමැති නම්, එබඳු භාණ්ඩ අවිනිශ්චිත භාණ්ඩ වේ.

උදා - ඉහත උදාහරණයේදී, ප්‍රසාද් ශෙහාන්ගේ භුක්තියෙහි පවතින වාහන **05**න් ඒ වනවිටදීත් හඳුනාගෙන නොමැති එක් වාහනයක් ගැනීමට එකඟ වූයේ නම්, ගිවිසුමේ විෂය වස්තුව අවිනිශ්චිත හෝ විශේෂිත නොවන භාණ්ඩයක් වේ.

**අනාගත භාණ්ඩ**

අනාගත භාණ්ඩ යන්නෙන් විකුණුම්කරු විසින් ගිවිසුමට එළඹීමෙන් පසුව අත්පත් කර ගැනීම හෝ නිෂ්පාදනය කිරීම සිදු කරන භාණ්ඩ අදහස් කරනු ලබයි.

උදා - ශෙහාන් විසින් ප්‍රසාද් සමග ජපානයෙන් ආනයනය කරනු ලැබූ හොන්ඩා සිවික් වාහනයක් විකිණීම සඳහා ගිවිසුමකට එළඹියේ නම්, එම වාහනය අනාගත භාණ්ඩයක් වේ.

***(ලකුණු 04)***
***(මුළු ලකුණු 10)***

## *තුන්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

***පරිච්ඡේදය 05 - සමාගම් නීතිය***

**(a)** පහත දැක්වෙන පුද්ගලයන් අධ්‍යක්ෂකවරුන් වශයෙන් පත්කිරීම සඳහා සුදුසුකම් නොලබයි. එබැවින්, පනත මගින් සුදුසුකම් නොමැති වශයෙන් පැහැදිලිවම දක්වා නොමැති කවර හෝ පුද්ගලයෙකු අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් පත් කරනු ලැබිය හැකි වේ. එකී නුසුදුසුකම් පහත පරිදි වේ.

1 වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයෙකු
2 බුන්වත් බවින් මිදී නොමැති පුද්ගලයෙකු
3 නීරෝගී මනසකින් යුක්ත නොවන බවට තීරණය කර ඇති පුද්ගලයෙකු
4 ස්වාභාවික පුද්ගලයෙකු නොවන අයෙකු
5 සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියෙහි දක්වා ඇති අධ්‍යක්ෂකවරුන් සඳහා වන කවර හෝ සුදුසුකමක් සමග නොසැසඳෙන කවර හෝ පුද්ගලයෙකු
6 වර්ෂ 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ අධ්‍යක්ෂකවරයෙකු වීම තහනම් කර ඇති පුද්ගලයෙකු
7 වර්ෂ 2007 අංක 07 දරණ සමාගම් පනතේ 213 සහ 214 වගන්ති යටතේ අධ්‍යක්ෂකවරයෙකු වීම තහනම් කර ඇති පුද්ගලයෙකු
8 පනතේ 213 වන වගන්තිය ප්‍රකාරව, පහත දැක්වෙන නඩු කටයුත්තකදී වරදකරු වීමෙන් හෝ තීන්දු කිරීමෙන් පසුව වසර පහක කාලයක් තුළදී, යම් පුද්ගලයෙකුට සමාගම කළමණාකරණය කිරීම තහනම් වේ.

යම් පුද්ගලයෙකු,

- මෙම පනත යටතේ සිරගත කිරීමෙන් දඬුවම් කරනු ලබන්නා වූ කවර හෝ වරදකට වරදකරු වූයේ නම්,
- වංක හෝ වංචනික ක්‍රියාවන් සම්බන්ධව වන වරදකට වරදකරු වූයේ නම්,
- වස්තු භංගත්ව ආඥා පනත යටතේ වස්තු භංගත්වයට පත්ව ඇති බවට තීන්දු කර වසර 5ක කාලයක් ඇතුළතදී අධ්‍යක්ෂකවරයෙකු ලෙස කටයුතු කිරීමට සුදුසුකම් නොලබනු ලබයි
- නීරෝගී මනසකින් යුක්ත නොවන බවට තීන්දු කර ඇත්නම්,

***(ලකුණු 04)***

SRI LANKA

**(b)** පහත කරුණු වලින් කවර හෝ කරුණු **4** ක්

1 සමාගමේ යහපත පිණිස සද්භාවයෙන් කටයුතු කිරීමට අධ්‍යක්ෂවරුන්ට ඇති යුතුකම (**187** වගන්තිය)

2 පනත අනුව සහ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුකූලව කටයුතු කිරීම සඳහා අධ්‍යක්ෂවරුන්ට ඇති යුතුකම (**188** වගන්තිය)

3 ස්වකීය දැනුම සහ පළපුරුද්ද ඇති තැනැත්තෙකුගෙන් යුක්ති සහගත වශයෙන් බලාපොරොත්තු විය හැකි නිපුණතාවයෙන් සහ සැලකිලිමත් භාවයෙන් ක්‍රියා කිරීමට ඇති යුතුකම සහ අනවධානයෙන් සහ බරපතල නොසැලකිලිමත් අන්දමින් ක්‍රියා නොකිරීම (**189** වගන්තිය)

4 වාර්තා, ප්‍රකාශ සහ මූල්‍යමය දත්ත සහ වෙනත් මූලාශ්‍රයන් සඳහා නිවැරදි තොරතුරු මත විශ්වාසය තැබීම, භාවිතා කිරීම අධ්‍යක්ෂවරයෙකුට සිදු කළ හැකිය. (**190** වගන්තිය)

5 සම්බන්ධතා අනාවරණය කිරීමට ඇති යුතුකම (**192** වගන්තිය)

6 සමාගමේ තොරතුරු අනාවරණය නොකිරීමට ඇති යුතුකම (**197** වගන්තිය)

7 අධ්‍යක්ෂකවරුන්ගේ කොටස් ගනුදෙනු අනාවරණය කිරීමට ඇති යුතුකම (**200** වගන්තිය)

8 පනතේ **216** වගන්තිය ප්‍රකාරව පමණක් අධ්‍යක්ෂවරුන්ගේ වැටුප් සහ වෙනත් ප්‍රතිලාභයන් සඳහා අනුමැතිය ලබා දීම

9 පනතේ **217** වන වගන්තිය යටතේ අනුමත කර නොමැති නම් අධ්‍යක්ෂවරුන්ට ණය මුදල්, ඇප බැඳුම්කර සඳහා එළඹීම් හෝ කවර හෝ සුරකුම් ලබා දීම සිදු නොකිරීම

10 වස්තු භංගත්වයට පත් වූ විටකදී අධ්‍යක්ෂකවරුන් **219** වන වගන්තියට අනුකූලව කටයුතු කළ යුතුය

11 බරපතල ප්‍රාග්ධන අහිමිවීමකදී අති විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමට ඇති යුතුකම

***(ලකුණු 04)***

aat SRI LANKA

**(c)** සීමාසහිත පුද්ගලික සමාගමක් සඳහා අවශ්‍ය වන අවම අධ්‍යක්ෂවරුන් ගණන එකකි (**01**).

***(ලකුණු 02)***

***(මුළු ලකුණු 10)***

## *හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර:*

| *පරිච්ඡේදය 10 - ව්‍යාපාරික පරිසරය සම්බන්ධ වැරදි* |
|---|

**(a)**

1 ව්‍යවසායන් අතර වන සීමා සහිත වෙළඳ ගිවිසුම් පාලනය කිරීම සහ ඉවත් කිරීම, ව්‍යවසායන් අතර මිල සඳහා වන විධිවිධානයන් නියාමනය කිරීම, මිල ගණන් පාලනය කිරීම, දේශීය හෝ අන්තර්ජාතික වෙළඳාම සඳහා ප්‍රතිවිරෝධී වශයෙන් බලපාන්නා වූ අසාධාරණ තරඟය මුලිනුපුටා දැමීම.

2 ප්‍රති- තරඟකාරී පරිචයන් සහ ආධිපත්‍ය පතුරවන ස්ථාවරයන් අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධව පරීක්ෂණ කිරීම හෝ විමර්ශනය කිරීම

3 භාණ්ඩ සහ සේවා සපයන පුද්ගලයන් අතර ඵලදායී තරඟයක් පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම

4 සපයනු ලබන භාණ්ඩ හා සේවාවන් සම්බන්ධව පවතින මිල ගණන්, උපයෝජ්‍යතාව සහ ගුණාත්මක භාවය සහ සැපයුම් විවිධාංගීකරණය සඳහා එකී භාණ්ඩ හා සේවා පාරිභෝගිකයන්ගේ, ගැණුම්කරුවන්ගේ සහ අනෙකුත් භාවිතා කරන්නන්ගේ අයිතීන් සහ සම්බන්ධතාවයන් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම

5 මිලදී ගැනීම සඳහා පවතින භාණ්ඩ සහ සේවාවන්ගේ ගුණාත්මක භාවය, ප්‍රමාණය, සඵලතාව, පවිත්‍රතාව, ප්‍රමිතීන් සහ මිල ගණන් සම්බන්ධව පාරිභෝගිකයන් දැනුවත් කිරීම

6 පනතේ දක්වා ඇති කවර හෝ කරුණක් සම්බන්ධව පරීක්ෂණ සහ විමර්ශනයන් සිදු කිරීම.

***(ලකුණු 06)***

**(b)**

වෙළෙන්දෙකු වශයෙන් සුරාජ්ට භාණ්ඩ විකිණීම ප්‍රතික්ෂේප කිරීමට විමල්ට නොහැක. පාරිභෝගික කටයුතු පනත යටතේ පහත කරුණු වෙළෙන්දෙකු විසින් සිදු කරනු ලබන ප්‍රධාන වරදවල් ගණයේ ලා ගැනේ.

1 කවර හෝ භාණ්ඩ සන්තකයේ තබාගෙන සිටින වෙළෙන්දෙකු විසින්,

- භාණ්ඩ විකිණීම ප්‍රතික්ෂේප කිරීම
- භාණ්ඩ සන්තකයේ තබා ගෙන සිටින බව ප්‍රතික්ෂේප කිරීම
- භාණ්ඩයේ මිල හැරුණු කොට වෙනත් කොන්දේසින්ට යටත්ව භාණ්ඩ විකිණීම
- අධික භාණ්ඩ ප්‍රමාණයක් සඟවා රැස් කර තැබීම

අධිකරණය මගින් දඬුවම් ලබා දිය හැකි වරදවල් ගණයේ ලා ගැනේ.

2 නීතියට අනුව, වලංගු සාක්ෂි නොමැතිව පාරිභෝගික අයිතීන් සුරක්ෂිත නොවේ. එබැවින්, මිලදී ගැනීම් සඳහා රිසිට්පතක් ඉල්ලා සිටීමට පාරිභෝගිකයන්ට අයිතියක් ඇත. පාරිභෝගිකයාට පහත කරුණු අන්තර්ගත රිසිට්පතක් ලබා දිය යුතුය.

- විකුණූ දිනය
- විකුණන ලද භාණ්ඩ ප්‍රමාණය.
- ගෙවන ලද මිල
- එය සිල්ලර හෝ තොග වෙළඳාමක්ද යන්න.

3 සෑම වෙළෙන්දෙකුම ඔහුගේ ව්‍යාපාරික ස්ථානයේ විකිණීමට ඇති භාණ්ඩ වල මිල ලැයිස්තුවක් ප්‍රදර්ශනය කිරීම අනිවාර්ය වේ.

4 ඔහුගේ ව්‍යාපාරික ස්ථානයෙහි අධිකාරිය මගින් නිකුත් කරන ලද දැන්වීම්, අවවාද ප්‍රදර්ශනය කිරීම සඳහා හොඳින් පෙනෙන ස්ථානයක සවි කරන ලද දැන්වීම් පුවරුවක් තිබිය යුතුය. එකී දැන්වීම් ඉවත් කරන හෝ වෙනස් කරන වෙළඳුන් පනත යටතේ වරදකරුවන් ලෙසින් සැලකේ.

5 තම ව්‍යාපාරික කටයුතු අතරතුරදී, කිනම් පාරිභෝගිකයෙකු හෝ වෙළන්දෙකු නොමග යැවීම හෝ රැවටීම වෙළඳුන් විසින් සිදු නොකළ යුතුය.

6 අධිකාරිය විසින් භාණ්ඩවල උපරිම මිල, නිෂ්පාදනය කරනු ලබන කවර හෝ භාණ්ඩයක තත්වය සම්බන්ධව කවර හෝ වෙළෙන්දෙකු සමග ලිඛිත ගිවිසුම් සඳහා එළඹිය හැකිය.

7 අධිකාරිය විසින් නම් කර ඇති ලේබල් සහිත භාණ්ඩයන්හි සිල්ලර මිල, නිෂ්පාදන කේතය සහ කල් ඉකුත්වීමේ දිනය අන්තර්ගත විය යුතුය.

8 භාණ්ඩයේ උපරිම මිල ඉක්මවා භාණ්ඩයන් විකිණීම හෝ ප්‍රදර්ශනය කිරීම

දී ඇති සිද්ධියෙහි, විමල්ගේ ක්‍රියාවන් හේතුවෙන් පහත අක්‍රමිකතාවයන් මතුව ඇත.

- **ලකුණු කර ඇති මිල ඉක්මවා කවර හෝ භාණ්ඩයක් විකිණීම හෝ විකිණීමට අර්පණය කිරීම**
  - වර්ෂ **2003** අංක **09** දරණ පාරිභෝගික අධිකාරී පනතේ **11** වන වගන්තිය පරිදි, ලකුණු කළ මිලට වඩා ඉහල මිලකට කවර හෝ භාණ්ඩයක් විකිණීම හෝ විකිණීමට අර්පණය කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් වන බැවින් රු.**1020** ක ඉහල මිලක් අලවන ලද ස්ටිකරයක් සහිත කිරි පැකැට්ටුවක් අර්පණය කිරීම එකී පනත යටතේ වන අපරාධමය වරදක් සංස්ථාපනය කරනු ලබයි.

- **භාණ්ඩ විකිණීම ප්‍රතික්ෂේප කිරීම**
  - වෙළඳාම් කිරීමේ අරමුණ සඳහා භාණ්ඩ සන්තකයේ තබාලගන සිටින වෙළෙන්දෙකු, ඒවා විකිණීම ප්‍රතික්ෂේප කිරීම පාරිභෝගික කටයුතු පනත යටතේ වරදක් ලෙසින් සලකනු ලැබේ. සුරාජ් විසින් සිල්ලර භාණ්ඩ විමල්ට විකිණීම ප්‍රතික්ෂේප කිරීම අපරාධමය වරදක් සංස්ථාපනය කරනු ලබයි.

**කරුණු එසේ බැවින්, විමල් අධිකාරිය විසින් හෝ මහේස්ත්‍රාත් අධිකරණය විසින් පනවනු ලබන සිරගත කිරීමකට හෝ දඩයකට යටත් වේ.**

***(ලකුණු 04)***

***(මුළු ලකුණු 10)***

## *පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

***පරිච්ඡේදය 06 - ගනුදෙනු කළ හැකි ලියවිලි***

**(a)**

බැංකුව ගෙවීම් සඳහා කවුන්ටරය වෙත ඉදිරිපත් කරනු ලබන රේඛනය කර නොමැති චෙක්පත් සඳහා ගෙවීම් සිදු කිරීමට බැඳී සිටී. දෙන ලද සිද්ධියේදී, පහත කරුණු සැලකිල්ලට ගත හැකිය.

- **රේඛනය කරන ලද චෙක්පත්**

බැංකුවට ඉදිරිපත් කරන ලද චෙක්පත "ගනුදෙනු කළ නොහැක" වශයෙන් දක්වන රේඛනයක් සහිත වේ. චෙක්පතක් රේඛනය කර ඇත්නම්, එය බැංකු කවුන්ටරයෙන් මුදල් බවට පත් කර ගත නොහැකි අතර එය උපලබ්ධි වීම සඳහා බැංකු ගිණුමක තැන්පත් කළ යුතුය.

- **චෙක්පතේ සඳහන් මුදලේ අක්‍රමිකතාවයන්**

තවදුරටත්, මෙම ගැටලුවේදී, චෙක්පත මත රුපියල් විසි පන්දහසක් පමණි යන්න අකුරින් සහ පනස් දෙදහසක් යන්න ඉලක්කමින් ලියා තිබුණි.

- **ගිණුමේ ප්‍රමාණවත් තරම් මුදල් නොතිබීම**

එසේම, චෙක්පතට මුදල් ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදල්ද ගිණුමේ නොමැත.

කරුණු එසේ බැවින්, බැංකුකරු විසින් ඉහත සියලු කරුණු සලකා චෙක්පත අගරු කළ යුතුය.


***(ලකුණු 06)***

SRI LANKA

**(b)**

**සාමාන්‍ය රේඛනය**

සාමාන්‍ය රේඛනය යනු චෙක්පතෙහි මුහුණතෙහි එකිනෙකට සමාන්තර තිරස් රේඛා දෙකක් පැවතීමයි. පුද්ගලයෙකුට වාණිජ බැංකුවක නමක් හැරෙන්නට කවර හෝ පිළිගත් ප්‍රකාශයක් එහි අන්තර්ගත කළ හැකිය. රේඛනය කරන ලද චෙක්පත් බැංකුකරු වෙත පමණක් නිකුත් කරන අතර එකී බැංකුව විසින් එම මුදල් ගෙවීම් සිදු කන බැංකුව විසින් ගෙවීම් සිදු කළ පසුව තැන්පත්කරුගේ ගිණුම වෙත බැර කරනු ඇත. දරන්නාට චෙක්පත කවර හෝ බැංකුවක තැන්පත් කළ හැකිය. සාමාන්‍ය රේඛනය සඳහා උදාහරණයන් පහත පරිදි විස්තරාත්මකව දැක්විය හැකිය.




**විශේෂ රේඛනය**

චෙක්පතක මුහුණතෙහි සම්මත ප්‍රකාශයන් ඇතුව හෝ නොමැතිව බැංකුවක නමක් දක්වා ඇත්නම්, චෙක්පත එකී බැංකුව වෙත විශේෂිතව රේඛනය කළා සේ සැලකේ. අවශ්‍ය නම්, යම් අයෙකුට " ගනුදෙනු කළ නොහැක" වැනි ප්‍රකාශයක් එක් කළ හැකිය. විශේෂ රේඛනයක් සිදු කර ඇති විටදී, එකී චෙක්පතෙහි වටිනාකම එකී රේඛනයෙහි දක්වා ඇති බැංකුවෙහි ගිණුමට බැර කළ යුතුය. විශේෂ රේඛනය සඳහා උදාහරණයන් පහත පරිදි විස්තරාත්මකව දැක්විය හැකිය.

සෙලාන් බැංකුව

සෙලාන් බැංකුව - අනුරාධපුර

ගනුදෙනු කළ නොහැක - මහජන බැංකුව

ආදායකයාගේ ගිණුමට පමණයි - ලංකා බැංකුව

රු.30000/- ක් දක්වා පමණයි - මහජන බැංකුව

***(ලකුණු 04)***
***(මුළු ලකුණු 10)***

### ***හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ***

| ***පරිච්ඡේදය 08 - රක්ෂණ නීතිය කුලී සින්නක්කර සහ කල් බදු*** |
|---|

**(a)**

රක්ෂණ ගිවිසුම් යනු උපරිම සද්භාවය (Uberrimae Fidei) මූලධර්මය මත පිහිටා ඇති ගිවිසුම් වේ. ඒ අනුව, රක්ෂණ ගිවිසුමට එළඹීම සඳහා වන අන් අයගේ තීරණය හෝ එලෙස ගිවිසුමට එළඹෙනුයේ කවර වාරික මුදලක් මත පිහිටාද යන්න කෙරෙහි බලපෑම් කළ හැකි වන්නා වූ සියලු තොරතුරු අනෙක් අයට හෙළි කිරීමට සියලු පාර්ශ්වයන් බැඳී සිටී. මෙම මූලධර්මය මගින් රක්ෂණ ගණුදෙනුවකට එක් වී ඇති පාර්ශ්වයන් සත්‍යවාදී වන බවට සාමාන්‍ය සහතික වීමක් ලබා දෙනු ලබයි. වැදගත් කරුණක් හෙළිදරව් කිරීමට අපොහොසත් වීම මගින් රක්ෂණ ගිවිසුම ශූන්‍ය කළ හැක්කක් බවට පත් කරනු ලබයි. වැදගත් කරුණු අවනිදේශනය කිරීම ගිවිසුමේ සද්භාවය උල්ලංඝනය කරනු ලබයි. එහි ප්‍රතිඵල වශයෙන් රක්ෂකයා විසින් ප්‍රතිලාභ ලබා දීම ප්‍රතික්ෂේප කිරීමක් ඇති වීමට හැක.

ලබා දී ඇති කරුණු අනුව පෙනී යන්නේ අපේක්ෂා විසින් රක්ෂණ ඔප්පුව ලබා ගන්නා අවස්ථාවේදී ඇයගේ සෞඛ්‍ය තත්වය පිළිබඳව කිසිවක් රක්ෂණ සමාගමට හෙලිකර නොමැති බවයි. කරුණු අවනිදේශනය කිරීම තුළින්, අපේක්ෂා උපරිම සද්භාවය (Uberrimae Fidei) යන මූලධර්මය කඩකිරීම සිදු කර ඇත. එබැවින්, රක්ෂණකරුවන් විසින් අව-ප්‍රකාශනය යන පදනම මත පිහිටා වගකීම ප්‍රතික්ෂේප කළ හැකි අතර එය රක්ෂණ නීතියට අනුව සාධාරණීකරණය කළ හැකි වේ. ඒ අනුව, අපේක්ෂාගේ යැපෙන්නන්ට ජීවිත රක්ෂණාවරණය මත පිහිටා වන්දි සඳහා හිමිකම් පෑමට නෛතික අයිතියක් නොමැත.

**නඩු තීන්දු නීතිය** - <u>ලූකර්</u> එදිරිව. <u>ලෝ යුනියන් රක්ෂණ සමාගම</u>

***(ලකුණු 07)***

**(b)**

1) නෛතික බැඳීමක් ඇති කිරීම සඳහා වන අරමුණ

2) රක්ෂණ අර්පණය හෝ යෝජනාව

3) ප්‍රතිග්‍රහණය

4) නෛතික වලංගුභාවය

5) සුදුසු පාර්ශ්වයන්

6) ප්‍රතිඡ්ඨාව

***(ලකුණු 03)***
***(මුළු ලකුණු 10)***

| ***B කොටසෙහි අවසානය*** |
|---|

(මුළු ලකුණු 25 කි)

**C කොටස**

***හත්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ***

| *පරිච්ඡේදය 02 - ගිවිසුම් නීතිය* |
|---|

**(A)**

**(a)**

**1) අර්පණය අවලංගු කිරීම**

අර්පණකරුට ප්‍රතිග්‍රහණයට පෙර කවර හෝ අවස්ථාවකදී අර්පණය අවලංගු කළ හැකිය. අර්පණකරු විසින් විශේෂිත කාල සීමාවක් සඳහා අර්පණය විවෘතව තබා ගන්නා බවට පොරොන්දු වී තිබුණේ වුවද, ප්‍රතිග්‍රහණයට පෙර කවර හෝ අවස්ථාවක එය අවලංගු කිරීමට ඔහුට නිදහස පවතී.

***නඩු තීන්දු නීතිය*** - රොට්ලෙජ් එදිරිව. ග්‍රාන්ට්

**2) අර්පණය ප්‍රතික්ෂේප කිරීම**

මෙය ආකාර දෙකකට සිදු විය හැකිය,

- පැහැදිලි ප්‍රතික්ෂේප කිරීම
- අර්පණලාභී වෙතින් ප්‍රති අර්පණයක් ලැබීම

ප්‍රති අර්පණයක් දෙආකාරයකින් සිදු විය හැකි වන අතර, එය මුල් අර්පණයට ප්‍රතිවිරුද්ධ නව අර්පණයක් ඉදිරිපත් කිරීමෙන් හෝ කොන්දේසි පනවමින් අර්පණය ප්‍රතිග්‍රහණය කිරීමෙන් විය හැකිය. ප්‍රති අර්පණයක් ඉදිරිපත් කිරීමේදී එමගින් මුල් අර්පණය ප්‍රතික්ෂේප වනු ලබන අතර මුල් අර්පණය අවසන් කිරීමක්ද සිදු වනු ලබයි.

***නඩු තීන්දු නීතිය*** - නිඇල් එදිරිව. මෙරෙට් සහ හයිඩ් එදිරිව. රෙන්ච්

**3) කල් ඉකුත් වීම**

අර්පණය විශේෂිත කාල සීමාවකදී හෝ සාධාරණ කාල සීමාවකදී ප්‍රතිග්‍රහණය කරනු නොලැබුවේ නම් අර්පණය අවසන් වනු ඇත. එය විශේෂිත කාල සීමාවක් ලබා දී ඇති සහ විශේෂිත කාල සීමාවක් ලබා දී නොමැති වශයෙන් ක්‍රම දෙකකට සිදුවිය හැකිය.

***නඩු තීන්දු නීතිය*** - රම්ස්ගේට් වික්ටෝරියා හොටෙල් එදිරිව. මොන්ටිෆියෝර්

**4) ව්‍යර්ථ වීම**

අර්පණකරුගේ හෝ අර්පණලාභියාගේ පාලනයෙන් තොරව යම් කිසිවක් සිදු වීම නිසා අර්පණය පසුකාලීනව ක්‍රියාත්මක කළ නොහැකි නම්, අර්පණය ව්‍යර්ථවීම නිසා අවසන් වූ ලෙස සැලකේ. උදාහරණයක් වශයෙන් ගිවිසුමේ විෂය වස්තුව විනාශ වීම, අර්පණකරුගේ හෝ අර්පණලාභියාගේ සිහිවිකල් වීම, අර්පණකරුගේ හෝ අර්පණලාභියාගේ මරණය හේතුවෙන් අර්පණය පසු කාලීනව සිදු කළ නොහැකි වීම ගත හැකිය.

***(ලකුණු 04)***

**(b)** රානි සහ ඒබීසී ලිමිටඩ් අතර ඇති වූ සිදුවීම ගිවිසුම් නීතියේ සඳහන් වන ප්‍රතිග්‍රහණය යන නෛතික සිද්ධාන්තය හා සමග සම්බන්ධ වේ. ප්‍රතිග්‍රහණය නිසි පරිදි දැනුම් දිය යුතු වේ.

ප්‍රතිග්‍රහණය යනු අර්පණලාභී විසින් අර්පණකරු වෙත දක්වනු ලබන කොන්දේසි විරහිත කැමැත්ත වේ. වලංගු ප්‍රතිග්‍රහණයක් නොමැති විටකදී වලංගු ගිවිසුමක් ඇති නොවේ. ප්‍රතිග්‍රහණය බලාත්මක වනුයේ එය අර්පණකරු වෙත නිල වශයෙන් සන්නිවේදනය කිරීමෙන් පසුව පමණක් වේ. එබැවින්, නිල නොවන හෝ අනවසර සන්නිවේදනයන් ප්‍රතිග්‍රහණය සිදු කිරීමේ වලංගු ක්‍රමයන් නොවේ.

***නඩු තීන්දු නීතිය*** - පවෙල් එදිරිව. ලී

ලබා දී ඇති අවස්ථාවට අනුව, රානි සහ ඒබීසී ලිමිටඩ් අතර ගැටලුවේදී ඒබීසී සමාගමේ තීරණය කිසිවිටකත් නිල වශයෙන් සන්නිවේදනය වී නොමැත. කරුණු එසේ බැවින්, ඒබීසී සමාගම විසින් රානි සහකාර ගණකාධිකාරී තනතුර සඳහා ප්‍රතිග්‍රහණය කිරීම හුදෙක් නිල නොවන සන්නිවේදනයක් වේ. ඒ අනුව, රානි සහ සමාගම අතර වලංගු ප්‍රතිග්‍රහණයක් හෝ ගිවිසුමක් නොපවතින බැවින්, රානිට ඒබීසී ලිමිටඩ්ට එරෙහිව සාධාරණ නෛතික ප්‍රතිකර්මයක් නොමැත.

***(ලකුණු 06)***

**(c)** මෙය ගිවිසුම් නීතිය පදනම්ව පවතී. ගිවිසුමක් යන්න නෛතික සබඳතාවයක් ඇති කර ගැනීමේ අරමුණ සහිතව පාර්ශ්වයන් අතර ඇතිවන එකඟතාවයක් වශයෙන් අර්ථ නිරූපණය කළ හැකිය. ගිවිසුමක් නිර්මාණය කරන්නා වූ මූලික අංග දෙක වනුයේ "අර්පණය" සහ "ප්‍රතිග්‍රහණය" වේ. ප්‍රතිග්‍රහණය යන්න අර්පණකරු විසින් අර්පණලාභී කෙරෙහි ඇති කරන ලද විශේෂිත නියමයන් මගින් බන්ධනය වීම සඳහා ලබා දෙන්නා වූ නිශ්චිත පොරොන්දුවක් වශයෙන් අර්ථ නිරූපණය කළ හැකිය. අර්පණය ලිඛිතව, වාචිකව හෝ ව්‍යංගයෙන් පවා සිදු කළ හැකිය. වලංගු ගිවිසුමක් ඇති කිරීම සඳහා එකී අර්පණය එය අවසන් වීමට පෙර සිදු කළ යුතුය.

මෙම සිදුවීමේදී රාජා විසින් ඔහුගේ නිවස රුපියල් මිලියන 15 ක මුදලකට විකිණීමට අර්පණයක් සිදු කර ඇත.

අර්පණය ප්‍රතික්ෂේප කිරීම මගින් අවසන් කළ හැකිය. අර්පණලාභියා අර්පණය ප්‍රතික්ෂේප කළ විටදී, එය අවසන් වේ. අර්පණය, ප්‍රති අර්පණයක් කිරීම මගින් ප්‍රතික්ෂේප කළ හැකිය. ප්‍රති අර්පණය කොන්දේසි පනවමින් අර්පණය පිළිගැනීම මගින් හෝ නව අර්පණයක් සිදු කිරීම මගින් කළ හැකිය.

මෙම සිදුවීමේදී, අමල් විසින් රුපියල් මිලියන 14ක මුදලකට නිවස මිලදී ගැනීම සඳහා සිය කැමැත්ත පළ කිරීම මගින් ප්‍රති අර්පණයක් සිදු කර ඇති අතර, ප්‍රති අර්පණය මගින් රුපියල් මිලියන 15කට නිවස විකිණීමේ මුල් අර්පණය ප්‍රතික්ෂේප වී ඇත. එබැවින් රාජා සහ අමල් අතර රු.මිලියන 14 ක් හෝ රු.මිලියන 15 ක් සඳහා වන වලංගු ගිවිසුමක් නොමැත.

aat SRI LANKA

තවදුරටත්, අමල් රු.මිලියන 15ක මුදලකට නිවස මිලදී ගැනීම සඳහා ඔහුගේ කැමැත්ත ප්‍රකාශ කර ඇත. කෙසේ වුවද, පෙර අර්පණයන් අවසන් වී ඇති බැවින්, එය නව අර්පණයක් සේ සැලකිය යුතුය. අමල් අර්පණකරු වන අතර රාජා අර්පණලාභී වේ. අර්පණය පිළිගත් පුද්ගලයා වශයෙන්, ඔහු වෙත ලැබුණු අර්පණය පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ නිදහස රාජා සතු වේ. කරුණු එසේ බැවින්, අමල් සහ රාජා අතර කිසිදු වලංගු අර්පණයක්, ප්‍රතිග්‍රහණයක් හෝ ගිවිසුමක් නොමැත.

***නඩු තීන්දු නීතිය -*** නිඇල් එදිරිව. මෙරෙට්

හයිඩ් එදිරිව. රෙන්ච්

***(ලකුණු 05)***

***පරිච්ඡේදය 10 - නියෝජ්‍යත්ව නීතිය***

**(B)**

**(a)** මෙය නියෝජ්‍යත්ව නීතිය යටතේ නියෝජිතයෙකුගේ වගකීම් මත පදනම්ව ඇත.

නියෝජ්‍යත්වය යන්න එක් පාර්ශ්වයක් විසින් අනෙක් පාර්ශ්වයට ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා බලය පවරන්නා වූ දෙපාර්ශ්වයක් අතර ඇතිවන විශ්වසනීය සබඳතාවයක් වන වශයෙන් හඳුනාගත හැකි අතර, එහිදී, එබඳු බලාධිකාරයක් පවරනු ලැබුවා වූ පාර්ශ්වය එකී බලාධිකාරය තමා වෙත පවරනු ලැබූ පාර්ශ්වය වෙනුවෙන් කටයුතු කිරීමට එකඟ වී ඇත. බලාධිකාරය හෝ බලය ලබා දෙන්නා වූ පුද්ගලයා "නියෝජක" වශයෙන්ද එය ලබා ගන්නා පුද්ගලයා "නියෝජිත" වශයෙන්ද නම් කර ඇත.

මෙහිදී, වීණා කැතීගේ ව්‍යාපාරයෙහි කළමණාකාරිනියක වශයෙන් සේවයේ නියුක්තව සිටින ලදී. ඒ අනුව, වීණා කැතී වෙනුවෙන් ව්‍යාපාර කටයුතු සිදු කරනු ලබයි. එබැවින්, වීණා කැතීගේ නියෝජිතයා වශයෙන් සැලකිය හැකි වන අතර, ඔවුන් අතර ඇති සබඳතාවය සඳහා නියෝජ්‍යත්ව නීතිය අදාල වනු ලබයි.

නියෝජ්‍යත්වය යනු විශ්වාසය මත පදනම් වූ සබඳතාවයක් වේ. ඒ අනුව, නියෝජිතයා විසින් නියෝජක වෙත සද්භාවීය යුතුකම් ඉටු කරනු ලැබිය යුතු වේ. කිසිදු නියෝජිතයෙකුට නියෝජ්‍යත්ව සබඳතාවය හේතුවෙන්, නියෝජක පිළිබඳව ලබා ගන්නා ලද රහස්‍ය තොරතුරු වෙනත් පුද්ගලයන්ට හෙළිදරව් කළ නොහැකි වන අතර, එය තම භාවිතය සඳහා යොදා ගැනීමටද නොහැකි වේ. රහස්‍යභාවයේ යුතුකම සබඳතාවය අවසන් වීමෙන් පසුවද පවතී.

***නඩු තීන්දු නීතිය*** - <u>ඒජී</u> එදිරිව. <u>බ්ලේක්</u>

මෙහිදී, වීණා විසින් කැතීගේ ව්‍යාපාර තොරතුරු ඇයගේ තරඟකාරී ව්‍යාපාරයේ අරමුණු සඳහා යොදා ගන්නා ලදී. ඇය තම නියෝජක කෙරෙහි පැවතිය යුතු සද්භාවයේ යුතුකම උල්ලංඝනය කර ඇත. එසේම තරඟකාරී ව්‍යාපාරයක් ආරම්භ කිරීම මගින්ද වීණා විසින් ඇයගේ අභිරුචීන් සහ නියෝජකගේ අභිරුචීන් අතර ගැටුමක් නිර්මාණය කර ඇත.

ඒ අනුව, නියෝජක වශයෙන් කැතීට වීණා සමග පවතින නියෝජිත සබඳතාවය අවසන් කිරීමට සහ කැතීගේ ව්‍යාපාරයේ තොරතුරු සහ සබඳතාවයන් යොදා ගනිමින් වීණා විසින් උපයා ගන්නා ලද හෙළිදරව් නොකළ ලාභයන් නැවත අය කරවා ගැනීමට වීණාට එරෙහිව නඩු පැවරීමටද අයිතියක් ඇත.

***(ලකුණු 05)***

**(b)**

ටෝනි කැතීගේ දේපල විකිණීම සඳහා ගැණුම්කරුවන් සොයා දෙන්නා වූ නියෝජිතයෙකු වශයෙන් කටයුතු කරනු ලබයි.

සෑම නියෝජිතයෙකුම නියෝජක වෙනුවෙන් කටයුතු කිරීමේදී නිසි සැලකිල්ලෙන් යුතුව කටයුතු කරනු ඇත්තේය යන්න අපේක්ෂා කරනු ලබයි. නියෝජිතයාගේ නොසැලකිල්ල හේතුවෙන් නියෝජකට හානියක් සිදු වුවහොත්, නියෝජිතයා විසින් එකී හානිය නියෝජක වෙත පූරණය කළ යුතු වේ.

ලබා දී ඇති ගැටලුවෙහි, ටෝනි විසින් වඩා ඉහල මිලකට මිලදී ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරන ලද ගැණුම්කරුවෙකු පිළිබඳ කැතීට හෙළි කිරීමට අපොහොසත් වන්නේ ඔහුගේ නොසැලකිල්ල හේතුවෙනි. කරුණු එසේ බැවින්, ටෝනි නියෝජිතයෙකු වශයෙන් නිසි සැලකිල්ල දැක්වීමේ යුතුකම උල්ලංඝනය කර ඇති බවට ප්‍රකාශ කළ හැකිය.

***නඩු තීන්දු නීතිය*** - <u>කෙපල්</u> එදිරිව. <u>වීලර්</u>

තවදුරටත්, ටෝනි විසින් කැතී ලබා දෙන ලද උපදෙස් පිළිපැද නොමැති අතර, එබැවින් ඔවුන් දෙදෙනාම අතර පැවති නියෝජ්‍යත්වයේ විශ්වාසය කඩ කර ඇත.

***නඩු තීන්දු නීතිය*** - <u>ටර්පින්</u> එදිරිව. <u>බිල්ටන්</u>

ඉහත දක්වා ඇති කරුණු හේතුවෙන් ටෝනි කැතීට සිදුවූ අලාභය සඳහා වන්දි ගෙවිය යුතුවේ. කැතී සතුව හානි සඳහා ටෝනිට එරෙහිව නඩු පැවරීමේ විකල්පය පවතී.

***(ලකුණු 05)***

***(මුළු ලකුණු 25)***

***C කොටසෙහි අවසානය***



aat SRI LANKA

## *Notice:*

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.
These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*